www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමා සහ ප්‍රාන්ත ආන්ඩුවල අයවැය අර්බුදය

## Obama and the fiscal crisis of the states

2009 ඔක්තෝබර් 17

ඔබාමා පරිපාලනයේ පන්ති ස්වභාවය එක සංඛ්‍යා ලේඛනයක් මගින් පමනක් වුවත් පැහැදිලි කල හැකිය. ජනාධිපති ඔබාමා ඩොලර් ට්‍රිලියන 12 කට වඩා මුදලක්, මූල්‍ය සම්පාදන, නය සහ සහතිකයන් ලෙස මූල්‍ය වෙලඳපලට මුදාහැර තිබෙන නමුත්, දැවැන්ත අයවැය හිඟයන්ට මුහුන දී සිටින ප්‍රාන්ත ආන්ඩු සඳහා ඔබාමා ඇත්ත වශයෙන් ම සම්පාදනය කර ඇත්තේ ඩොලර් බිලියන 30 ක් පමන වන, ෆෙඩරල් උත්තේජක අරමුදලෙන් හතරේ පංගුවකින් සියයට එකක ප්‍රතිශතයක් පමනි.

අයවැය පියවාගත නොහැකිව බිඳ වැටීමේ අර්බුදයකට මුහුනපා සිටින රටේ විශාලතම ප්‍රාන්ත වන කැලිෆෝනියා සහ පෙන්සිල්වේනියා ද ඇතුලත් ප්‍රාන්තවලට, පරිපාලනය හදිසි ආධාර සැපයීම ප්‍රතික්ෂේප කලේ ය. රටේ ප්‍රාන්ත පුරාම කම්කරුවන් රැකියාවලින් දොට්ට දැමීම සහ අධ්‍යාපනය, සෞඛ්‍ය ආරක්ෂනය සහ අනෙකුත් අත්‍යාවශ්‍ය සමාජ වැඩ සටහන් වල වියදම් කප්පාදු මත ධවල මන්දිරය පදනම්ව සිටියි.

ප්‍රාන්ත රාජ්‍ය මුහුන දී තිබෙන්නේ පෙර නුවූවිරූ අර්බූදයකටය. මෑතකදී අවසන් වූ මූල්‍ය වර්ෂයේ අයවැය පියවාගැනීම සඳහා ප්‍රාන්ත ආන්ඩු, විශාල ප්‍රමානයේ රැකියාවලින් දොට්ට දැමීම්, වැටුප් නොගෙවා දොට්ට දැමීම්, වැටුප් කප්පාදුව, විටින් විට දින ගනන් කාර්යාල වසා තැබීම සහ සේවාවන්වලට එල්ල කරන ප්‍රහාර අතරතුර නැවතත් හිඟයන් ගොඩගසමින් සිටියි.

මේ සතියේ ප්‍රකාශයට පත් වූ ආන්ඩුවේ නෙල්සන් ඒ. රොක්ෆෙලර් ආයතනයට අනුව, වසර 50 ක වාර්තා බිඳහෙලමින් අප්‍රේල් සිට ජුනි දක්වා බදු ආදායම සියයට 16.6 කින් පහත වැටුනි. ප්‍රාන්ත රාජ්‍ය 49 ක ම ආදායම් පහත වැටීමක් පෙන්නුම් කල අතර ඉන් 36 ක් ඉලක්කම් දෙකේ අගයන් පෙන්නුම් කලේ ය.

ජූලි මාසයෙන් අවසන් වූ මුදල් වර්ෂයේදී මෙන් ම ජූලි සිට අගෝස්තු දක්වා ද බදු ආදායම සියයට 8 පහත වැටීමට නියමිත බව ආරම්භක දත්ත වලින් පෙන්නුම් කෙරෙයි.

බොහෝමයක් ප්‍රාන්ත ලබන වසර සඳහා සිය අයවැය ජූලි මාසයේ දී සම්මත කලේ ය. යන්තම් මාස දෙකක් ඉක්ම ගිය තැන අඩු තරමින් ප්‍රාන්ත 18 ක් අනපේක්ෂිත පරිදි ක්‍රියාකාරී හිඟයන්ට මුහුනපෑ අතර, එය තුඩු දෙනු ඇත්තේ රාජ්‍ය සේවාවන්ගේ තවදුර කප්පාදු කිරීම් වලට ය.

පුලුල් තක්සේරුවකට අනුව, ප්‍රාන්ත අයවැය අර්බූදයට හේතු වී ඇත්තේ ඇමරිකානු කම්කරු පන්තියේ දුප්පත්කමයි. රැකියාවලින් දොට්ට දැමීම් සහ වැටුප් කප්පාදුව තුඩුදී ඇත්තේ, අදාල වර්ෂය තුල ආදායම් බදු එකතු කිරීම් සියයට 27.5 න් පහත වැටීමටයි. රොකෆෙලර් ආයතනයට අනුව වෙහෙසට පත් කම්කරුවන් බලාපොරොත්තු විය හැකි පරිදිම පාරිභෝගික භාන්ඩ වෙනුවෙන් කරන ලද අඩු වියදම් හේතුවෙන් වෙලඳ බදු බිල්පත් සියයට 9.5 කින් පහල වැටී ඇත.

පහත වැටෙන නිවාස මිලගනන් හේතු කොට ගෙන බොහෝ කොටම රජයේ පාසැල් සඳහා මුදල් සැපයූ, ප්‍රාන්ත වල දේපල බදු ආදායම්වලට පහර වැදී ඇත.

ඉහල නගින විරැකියාව තුඩුදී ඇත්තේ ප්‍රාන්ත බංකොලොත් කිරීමට පමනක් නොවේ. එය මහා අවපාතයෙන් මෙහා අත් නොදුටු සමාජ

අර්බුදයක් නිර්මානය කරමින් තිබේ. මිචිගන්, නෙවාඩා, රෝඩ් අයිලන්ඩ්, කැලිෆෝනියා සහ ඔරිගන් යන ප්‍රාන්ත පහේ නිල විරැකියා අනුපාතය සියයට 12 ටත් වඩා ඉහල නැගී ඇති අතර එහි ඉදිරියෙන්ම සිටින්නේ සියයට 15.3 ක් වාර්තා කරන මිචිගන් ප්‍රාන්තයයි.

සමාජ අර්බුදය ප්‍රාන්ත අයවැය මත පෙර නොවූ විරූ බලපෑම් ඇති කරයි. විරැකියා රක්ෂනය, ආහාර මුද්දර හා දුප්පතුන්ගේ වෛද්‍ය පහසුකම් සඳහා වන පිරිවැයෙන් අඩක්ම සපයනු ලබන්නේ සාමාන්‍යයෙන් ප්‍රාන්ත වල අරමුදල් වලිනි. එමෙන්ම රජයේ පාසල් හා විද්‍යාල වෙනුවෙන් ද ඔවුන් මූල්‍යාධාර සපයනු ලබයි.

විශාල ලෙස රැකියා කප්පාදු කිරීම් හෝ රැකියාවලින් දොට්ට දැමීම් පිලිබඳව නැත්නම් එසේ කිරීමේ තර්ජනය සෑම දිනක දී ම වාර්තාවේ:

• මැසසුචෙස්ට්ස්හි ඩිමොක්‍රටික් ආන්ඩුකාර ඩෙවල් පැට්‍රික්, ඩොලර් මිලියන 600 ක හිඟය පියවා ගැනීම සඳහා වේතන හා දීමනා කැපීමක් කම්කරුවන් විසින් පිලි නොගතහොත්, 2,000 ගේ රැකියා අහෝසි කරන බවට පසුගිය දිනක තර්ජනය කලේ ය.

• එදින ම, නිව් යෝක්හි ඩිමොක්‍රටික් ආන්ඩුකාර ඩේවිඩ් ඒ. පැටර්සන්, මේ වසරේ ඩොලර් බිලියන 3 ක කප්පාදු වැඩ සටහනක් ප්‍රකාශයට පත් කොට ඉදිරි වසර තුනට ප්‍රාන්තය ඩොලර් බිලියන 50 ක හිඟයකට මුහුන දී සිටින බවට අනතුරු ඇඟවීය. අධ්‍යාපනය, වෛද්‍ය රක්ෂනය හා පොදු ප්‍රවාහනයේ විශාල කප්පාදු කිරීම් ද සෑම ප්‍රාන්ත ආයතනයකටම අයවැයෙන් වෙන්කරන මුදල ඩොලර් 500 කින් අඩු කිරීමට ද ඔහු යෝජනා කලේ ය.

• අයෝවාහි ඩිමොක්‍රටික් ආන්ඩුකාර චෙට් කල්වර් ගිය සතියේ දී නියෝග කලේ, ප්‍රාන්තය පුරාම විහිද යන පරිදි ආන්ඩුවේ වියදම් ශීර්ෂ සියයට 10 කින්, එනම් ඩොලර් මිලියන 565 කින් කපා හැරීමටය. එහි ප්‍රතිපලය වනු ඇත්තේ රජයේ සේවකයන් 1,000 ගේ රැකියා අහෝසි වීම යයි සඳහන් වේ...

• දැනටමත් කපාහැර තිබෙන මිලියන 753 ප්‍රමානවත් නොවන බව තේරුම් ගැනීමෙන් පසුව, ඊලඟ වසරේ අයවැයෙන් අමතරව මිලියන 350 ක් ටෙනසී ප්‍රාන්ත ආන්ඩුව විසින් කපා හරිනු ඇත. සෞඛ්‍ය වැඩසටහන්, ප්‍රාන්ත සහන අනෙකුත් කප්පාදු කිරීම් අතරට ගැනේ. මිලියන 750 ක් වන, මෑතක් වන තුරුම ගෙවනු ලැබූ "වැසි දින අරමුදල" අහෝසි කෙරෙනු ඇත.

ප්‍රාන්ත මුහුන දෙන තත්ත්වය තවදුරටත් බාදනය වනු ඇතැයි බලාපොරොත්තු වේ. විරැකියා අනුපාතය මෙන්ම, ප්‍රාන්තයේ හා පලාත් ආන්ඩුවල මූල්‍ය පිලිබඳ නිරෝගී භාවය "ලැග සිටින දර්ශකයක්" වනු ඇතැයි සැලකේ.

මූල්‍ය අධ්‍යයන කටයුතු පිලිබඳ විශේෂඥයෙකු වන රොබට් බී. වාර්ඩ් රොකෆෙලර් ආයතනයත් සමග ප්‍රකාශ කලේ "ආර්ථික පසුබෑමේ අවසානයක් ප්‍රාන්තවල අයවැය ප්‍රශ්නයේ අවසානයක් නොවන බවයි." "දීර්ග හා වෙහෙසකර වසර දෙක තුනක හෝ ඊටත් වඩා වැඩි කාලයක අසීරු ගමනක්" වාර්ඩ් අපේක්ෂා කරයි.

ප්‍රාන්ත ව්‍යවස්ථා සම්පාදකයන්ගේ ජාතික සම්මේලනයේ කොරිනා එල්. එකල් සඳහන් කලේ, පසුගිය ආර්ථික පසුබෑම 2001 දී අවසන් වුවත්, ප්‍රාන්ත අයවැය තවත් වසර දෙකකටත් වඩා පිරිහෙමින් තිබුනු බවයි.

ෆෙඩරල් උත්තේජක මුදල් 2011 මුදල් වර්ෂයෙන් පසුව අවසන් වූ විට ප්‍රාන්තයන්ගේ අර්බුදය තවදුරටත් සංකීර්න වනු ඇත. උත්තේජකයන් මගින් ප්‍රාන්ත වලට ප්‍රධානය කල මුදල් ප්‍රමානය මූල්‍ය අර්බුදය විසින් කුරුම්ට් බවට පත්කරනු ලැබුව ද ( මේ වසරේ ඒකාබද්ධ බදු ආදායමෙන් අහිමි වී ඇති ඩොලර් බිලියන 63 මුදල් ප්‍රමානය, ප්‍රාන්ත ලබාගෙන ඇති උත්තේජක මුදල් ප්‍රමානය මෙන් දෙගුනයක් තරම් වේ) සමහර අවස්ථාවල දී සම්පූර්න බිඳ වැටීමක් එමඟින් වලක්වනු

ලැබුනි. උදාහරනයක් ලෙස මිචිගන්හි ඩොලර් බිලියන 2 ක් වන 2010 වසරේ අයවැය හිඟය පියවා ගැනීමට මිලියන සිය ගනනක උත්තේජක මුදල් යොදා ගැනීමට නියමිතය.

මෙම මුදල් අවසන් වූ පසු සමාජ වියදම්වල දැඩි කප්පාදු කිරීම් සිදුවනු ඇති බව නීති සම්පාදකයින් අවංකව පිලිගනු ලබයි. දැන් සිදු කෙරෙමින් පවතින දොට්ට දැමීම් සහ රාජ්‍ය සේවාවන්ගේ අඩු කිරීම්, කලින් ආර්ථික බිඳවැටීම් වලින් පසුව සිදුවූ ආකාරයට නැවත යථා තත්ත්වයට පත් නොවනු ඇති බව ද පුලුල් වශයෙන් පිලිගනු ලබයි.

"අපගේ උපායන් තුල ජීවත් වීම" සහ "රලු තීන්දු" යන නාමයෙන් ඔබාමා පරිපාලනය දෙවන උත්තේජක පැකේජයට විරුද්ධ වෙයි.

කැලිෆෝනියා අයවැය අර්බුදයේ උච්චතම අවස්ථාවේ දී, ප්‍රාන්තය එහි ඩොලර් බිලියන 26 ක් වූ හිඟය පියවා ගැනීම සඳහා ඔබමා පරිපාලනයට ආයචනය කලේය. ප්‍රාන්ත සිය "නය ගැනීමේ හැකියාව නංවනු ඇති ප්‍රතිසංස්කරන ක්‍රියාවේ යෙදවිය යුතු" බව කියා සිටිමින් ඔබාමා පරිපාලනය මේ ඉල්ලීම මුලුමනින්ම ප්‍රතික්ෂේප කලේ ය.

ප්‍රාන්ත විසින් සමාජ ප්‍රතිසංස්කරන වලට විරෝධය දැක්වූ අවස්ථාවල ෆෙඩරල් ආන්ඩුව ඒ වෙනුවෙන් පෙනී සිටි ජාතියේ ඉතිහාස කාල පරිච්ඡේදයන්ගෙන් ඓතිහාසික පසුබෑමක් සලකුනු කරමින් ප්‍රාන්ත සම්බන්ධයෙන් ෆෙඩරල් ආන්ඩුව දැන් ඉටුකරන්නේ ප්‍රතිගාමී භූමිකාවකි.

1950 ගනන් සහ 1960 ගනන්වල දී අප්‍රිකානු-ඇමරිකානු කම්කරුවන්ගේ මහජන අරගලවලට ප්‍රතිචාර ලෙස අයිසන්හවර්, කෙනඩි සහ ජොන්සන් පරිපාලනයන් ගත් ක්‍රියාමාර්ගයන් මාලාවක් සමඟින් දකුනේ ප්‍රාන්ත අගනුවරවල් වලට එරෙහිව වොෂින්ටනය පොරයට පිවිසුනි. 1930 ගනන්වල දී ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට්ගේ නිව්ඩීල් ප්‍රතිසංස්කරන නීති, ප්‍රාන්ත බලලෝබීන්ගේ හෙලාදැකීමට ලක්වූ අතර, මධ්‍යම ආන්ඩුව ප්‍රාදේශීය පාලනය බලහත්කාරයෙන් පැහැර ගන්නේ යයි චෝදනා නැඟුහ. තවද, 1861 සිට 1865 දක්වා, ඒබ්‍රහම් ලින්කන් යටතේ මධ්‍යම ආන්ඩුව සාර්ථක ලෙස සිවිල් යුද්ධය ගෙන ගිය අතර එය අවසන් වූයේ වහල් හිමිකම සහ දකුනු ප්‍රාන්තවල වහල් හිමි පන්තියේ විනාශයෙනි.

ඔබාමා යටතේ මධ්‍යම ආන්ඩුව ඉටු කරන්නේ ඊට ප්‍රතිවිරුද්ධ භූමිකාවකි. ප්‍රාන්ත ආන්ඩු දිනක් පාසා බිඳී විසිරී යමින් තිබෙන අතර, ඒවායේ සමාජ සේවාවන් මත යැපෙන වැඩ කරන ජනතාව ද සිය දිවි පැවැත්ම මේ වැඩ සටහන් මත රැඳී ඇති සේවකයන් ද ධවල මන්දිරයේ පරිපූර්න නොතැකීමට මුහුන දී සිටිති.

වොෂින්ටනය සහ ප්‍රාන්ත අතර මෙම නව සම්බන්ධතාව, දීර්ග කාලයක සිට පවතින ජාතියේ දේශපාලන ජීවිතයේ පුපුරන සුලු කේන්ද්‍රාපසාරී ප්‍රවනතාවන් යලි ඇවිලීයාමට පමනක්ම තුඩු දෙනු ඇත.

ආන්ඩුවේ සෑම අංශයක්ම පාලනය කරන වෝල් වීදියේ පිලිවෙත්වලට එරෙහි මහජන විරෝධය වැඩී යද්දී නොවැලැක්විය හැකි පරිදිම එය ගනු ඇති එක් රූපයක් වන්නේ ෆෙඩරල් පද්ධතිය තුල ආතතිය තියුනු වීමයි.

ටොම් එලී

© www.wsws.org